**චක්‍ර ලේඛ අංක: 03/2004**

මගේ අංකය:-බප/සසේකෝ/ලේ
සමුපකාර සේවක කොමිෂන් සභාව,
අංක 50, කිතුල්වත්ත පාර,
කොළඹ 08.
2004.09.01

බස්නාහිර පළාතේ සියලුම සමුපකාර සමිති
සභාපතිවරුන් වෙත,

<u>උපාධිධාරීන් සඳහා අතිරේක දීමනාවක් ගෙවීම</u>

දැනට සමුපකාර සමිතිවල විවිධ තනතුරු දරණ උපාධිධාරීන් එකී තනතුරුවල වැටුප ලැබීමේ අපහසුතාවය පිළිබඳව විවිධ අවස්ථාවන්හිදී ඉදිරිපත් වූ කරුණු සලකා බැලීමෙන් පසුව 2004.09.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් කොන්දේසිවලට යටත්ව, මාසිකව රු. 2500/- ක අතිරේක දීමනාවක් උපාධිධාරීන් සඳහා ගෙවීමට කොමිෂන් සභාව (බ.ප.) තීරණය කර ඇත.

01. සමිතියේ පැවැත්ම පිළිබඳ නිසි නිගමනයකින් පසු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම දීමනාව ගෙවීම හෝ නොගෙවීම පිළිබඳව තීරණය ගැනීම

02. එසේ තීරණය කිරීමේදී ග්‍රාමීය බැංකු අංශය විසින් උපයන ලාභය හැර සමිතිය විසින් ලබන ලාභය මත මෙකී තීරණ ගැනීමේදී සලකා බැලීම.

03. මෙම දීමනාව ලබා ගන්නා උපාධිධාරීන් අවම වශයෙන් වසරක් සමිතියේ සේවයේ රැඳී සිටින බවට ගිවිසුමකට එළඹීම සහ ඉන් පෙර ඉවත්ව යන්නේ නම් ~~නියමිත නියමයන්ට~~ අමතරව ලබාගත් දීමනාව ද සමිතියට ගෙවිය යුතු වීම.

04. පාඩු ලබන සමුපකාර සමිති මෙම දීමනාව ගෙවීමට ප්‍රමාණවත් ලාභ තත්ත්වයක් සලසා ගැනීමට ප්‍රයත්න දැරිය යුතුයි.

05. <u>කොමිෂන් සභාව විසින් උපාධිධාරීන් සඳහා නව වැටුප් ක්‍රමයක් සකස් කිරීමෙන් අනතුරුව මෙම දීමනාව අත් හිටුවීම</u>

මෙම ගෙවීම සම්බන්ධව එකඟතාවයකට පත්වන බස්නාහිර පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් ද සඳහන් කර සිටින්නේ මෙම දීමනාව ගෙවීමේදී සමුපකාර සමිතියේ ධාරිත තත්ත්වය ද ගණන් ගත යුතුය යන්නයි. එබැවින් ඒ පිළිබඳ සමුපකාර සමිති අධ්‍යක්ෂ මණ්ඩලයේ විශේෂ සැලකිල්ල යොමු කළයුතු බවත්, දැනට පවත්නා නීති අනුව එය අත්‍යවශ්‍ය බවත් කොමිෂන් සභාව විසින් නිගමනය කරයි.

කොමිෂන් සභාවේ නියමය පරිදි,

ජේ.ජේ. සිරිසේන,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව (බ.ප.)

පි/
1. සභාපති, සමුපකාර අධිකාරිය (බ.ප.)
2. සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් (බ.ප.)